කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2016 (නව නිර්දේශය)

2022 මාර්තු/අප්‍රේල්
සමාජීයවිද්‍යා පීඨය
සංවර්ධන අධ්‍යයනය - DVST E 1015

# සංවර්ධනයට හැඳින්වීමක්

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

1. මානව යහපත ක්‍රමානුකූලව ලඟා කර ගැනීම සඳහා "සංවර්ධන ක්‍රියාවලිය" මැනවින් අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙන්න. (ලකුණු 20)

2. සංවර්ධනය පහසුවෙන් නිර්වචනය කල නොහැකි වන්නේ මන්දැයි සංවර්ධනය පිළිබඳව ඉදිරිපත්ව ඇති නිර්වචන ඇසුරින් ම පෙන්වා දෙන්න. (ලකුණු 20)

3. සංවර්ධනය මැනීම සඳහා යොදා ගන්නා සංවර්ධන මිනුම් මොනවා දැයි දක්වා ඉන් එක් මිනුමක වැදගත්කම උදාහරණ ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 20)

4. සංවර්ධන සංකල්පයේ කාලානුරූප වෙනස් වීම සමාලෝචනය කරන්න. (ලකුණු 20)

5. සංවර්ධනයේ දිගු කාලීන පැවැත්ම සඳහා 'ස්වභාවික සම්පත්' තිරසාර අයුරින් පරිහරණය කිරීමේ අවශ්‍යතාව ගෙනහැර දක්වන්න. (ලකුණු 20)

6. තිරසාර සංවර්ධන අභිමතාර්ථ (SDGs) ගෝලීය සංවර්ධනයේ තිරසාරත්වයට බලපාන ආකාරය උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 20)

7. ශ්‍රී ලංකාවේ වර්තමානයේ මුහුණ පාන සංවර්ධන ගැටලු සඳහා පසුබිම් වන සාධක සහේතුකව පැහැදිලි කරන්න. (ලකුණු 20)

8. පහත දැක්වෙන මාතෘකා දෙකක් (02) තෝරා ගෙන ඒවාට කෙටි සටහන් සපයන්න.

   i. සාධාර්මික සංවර්ධන සුසමාදර්ශය
   ii. සහභාගීත්ව සංවර්ධනය
   iii. දිළිඳුකම පිටුදැකීම
   iv. තාක්ෂණය සහ සංවර්ධනය (ලකුණු 10x2=20)